**1.** **තනතුර - ශාරීරික අභ්‍යාස උපදේශක**

**2.** **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමකින් ශාරීරික අධ්‍යාපනය පිළිබඳව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - MA 2-2 2025

මූලික වැටුප - රු. 46,960.00 (2026), රු. 50,540.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 46,960.00 + 17800.00 x 12 = රු. 777,120.00 (2026)

50,540.00 +17800.00 x 12 = රු. 820,080.00 (2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. කාර්යාංශය වෙතින් සකස් කරනු ලබන වාර්ෂික පුහුණු සැලැස්මට අනුව අභ්‍යාසලාභීන් මනා ශරීර සෞඛ්‍යයකින් හා යහපත් මානසික ඒකාග්‍රතාවයෙන් යුතුව පවත්වා ගෙන යාමට අවශ්‍ය ශාරීරික අභ්‍යාස සඳහා අවැසි උපදේශන කටයුතු කිරීම.

ii. අසනීප හා විවිධ මානසික මට්ටම් වල හා වයස් සීමාවන් වල සිටින අභ්‍යාසලාභීන් හඳුනාගෙන ඔවුන්ට ගැලපෙන පරිදි සහ මධ්‍යස්ථානයේ අරමුණු ඉටුවන ආකාරයට සුදුසු ශාරීරික අභ්‍යාස කටයුතු සඳහා යෙදවීම.

iii. කායවර්ධන ව්‍යායාම උපකරණ භාවිතයේ නිවැරදි ක්‍රමයන් හඳුන්වාදීම, කායවර්ධන මධ්‍යස්ථානය නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම.

iv. නියමිත කාල සටහනකට අනුව කායවර්ධන මධ්‍යස්ථානය/ව්‍යායාම ශාලාව පවත්වා ගෙන යාම සහ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම වේදයකට අනුකූලව පවත්වා ගෙන යාම.

v. පුනරුත්ථාපනලාභින් සඳහා විනෝදජනක, ආරක්ෂිත සහ ඵලදායි යෝග්‍යතා පත්ති සහ ව්‍යායාම සැලසුම් කිරීම/පැවැත්වීම හා මධ්‍යස්ථාන වෙතින් සිදු කරනු ලබන ක්‍රීඩා උත්සව හා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

vi. කායවර්ධන/ව්‍යායාම් කටයුතු සඳහා ඇති භෞතික සම්පත් නඩත්තු කිරීම හා ස්ථාවර නියෝග අනුව ආරක්ෂා කර ගැනීම.

vii. වෙනස් විය හැකි කාලගුණ හා දේශගුණික තත්ත්වයන් අනුව අභ්‍යාසයන් කරන අවස්ථාවන් වලදී නිසි බලධාරියෙකුගේ අනුමැතිය මත පමණක් එය ක්‍රියාවේ යෙදවිම.